UNITED NATIONS
HUMAN RIGHTS COUNCIL

# විශ්ව කාලාන්තර සමාලෝචනය (Universal Periodic Review – UPR) මගින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව පරීක්ෂා කිරීමට නියමිතයි

**ජිනීවා (2023 ජනවාරි 27)** - එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශ්ව කාලාන්තර සමාලෝචන (UPR) කාරක කණ්ඩායම විසින් 2023 පෙබරවාරි 1 වැනි බදාදා දින දී webcast live රූස්වීමකින්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව හතරවන වරට පරීක්ෂා කරනු ඇත.

2023 ජනවාරි 23 සිට පෙබරවාරි 03 දක්වා පැවැත්වීමට නියමිත සැසියේ දී UPR කාරක කණ්ඩායම විසින් සමාලෝචනය කිරීමට නියමිත රටවල් අතරින් එකක් වන ශ්‍රී ලංකාවෙහි පළමු, දෙවන සහ තෙවන UPR සමාලෝචන පිළිවෙලින් 2008 මැයි, 2012 ඔක්තෝබර් සහ 2017 නොවැම්බර් යන කාල වලදී  අනුමත කරන ලදී.

මෙකී සමාලෝචනඃ 1) ජාතික වාර්තාව - සමාලෝචනය යටතේ අදාළ රාජ්‍යය විසින් සපයනු ලබන තොරතුරු; 2) විශේෂ කාර්යපටිපාටි නමින් හැඳින්වෙන ස්වාධීන මානව හිමිකම් ප්‍රවීණයන්ගේ සහ කණ්ඩායම් වල වාර්තාවන් හි අඩංගු තොරතුරු, මානව හිමිකම් ගිවිසුම් පිළිබඳ ආයතන, සහ එක්සත් ජාතීන්ගේ අනෙකුත් සංවිධාන; 3) ජාතික මානව හිමිකම් ආයතන, කලාපීය ආයතන, සහ සිවිල් සමාජ කණ්ඩායම් ඇතුළු වෙනත් පාර්ශ්වකරුවන් විසින් ලබා දුන් තොරතුරු යන ලේඛන මත පදනම් වේ.

2023 පෙබරවාරි 1 දින ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිදු කෙරෙන සමාලෝචනයේ පදනම වශයෙන් කටයුතු කරනු ලබන **වාර්තා** තුන මෙතැනින් සොයා ගත හැකිය.

**ස්ථානයඃ** කාමර අංක 20, පලෙයි ඩි නසියෝන්, ජිනීවා

**වේලාව සහ දිනයඃ** 2023 පෙබරවාරි 1 වැනි බදාදා 09.00 – 12.30 (ජිනීවා වේලාවෙන්, GMT + පැය1)

UPR යනු සුවිශේෂී ක්‍රියාවලියකි. එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් 193 කි. එකී සියලුම රටවල මානව හිමිකම් වාර්තා කාලාන්තර සමාලෝචනයට ලක් කිරීම එම ක්‍රියාවලිය මගින් සිදු කෙරෙයි. එහි පළමු රැස්වීම පවත්වන ලද්දේ 2008 අප්‍රේල් මාසයේ දී ය. එතැන් සිට එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් 193 සමාලෝචනයට ලක් කිරීම පළමු, දෙවැනි සහ තෙවැනි UPR චක්‍රයන් හි දී තෙවරක් ම සිදු කෙරිණ. සතරවැනි UPR චක්‍රයේ දී, තම තමන්ගේ රාජ්‍යයන් සම්බන්ධයෙන් පෙර-සමාලෝචන වලදී ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ක්‍රියාවට නැංවීම උදෙසා ඔවුන් විසින් ගන්නා ලද පියවර එකිනෙක ගෙනහැර පානු ඇතැයි නැවතත් අපේක්ෂිතය. එකී සමාලෝචන අනුව කටයුතු කිරීමට එම රාජ්‍යයන් ඇප-කැප විය යුතු අතර, තම රාජ්‍යය සම්බන්ධයෙන් මානව හිමිකම් වල සංවර්ධනය ඉස්මතු කර දැක්වීමට ද ඔවුන් කටයුතු කළ යුතු වේ.

ශ්‍රී ලංකා නියෝජිත පිරිසෙහි ප්‍රධානියා වන්නේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය, අලි සබ්‍රි මහතා ය.

වාර්තාකරුවන් (“troika”) වශයෙන් ක්‍රියා කරමින් ශ්‍රී ලංකාව සමාලෝචනය කරන රටවල් තුනේ නියෝජිතයන් වන්නේ ඇල්ජීරියාව, මහා බ්‍රිතාන්‍යයේ සහ උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානිය, සහ කටාර් රාජ්‍යයයි.

**webcast** සැසිය වෙත යොමුවීමට at https://media.un.org/en/webtv/schedule/2023-02-01 පිවිසෙන්න.

ශ්‍රී ලංකාව සමාලෝචනය කෙරෙන අවස්ථාවේ දී ලබාදීමට නියමිත ප්‍රකාශන සහ කථිකයන්ගේ ලැයිස්තුව UPR Extranet වෙතින් දැක්වෙනු ඇත.

2023 පෙබරවාරි 3 දින 16.30 ට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිදු කරනු ලබන **නිර්දේශයන්** UPR කාරක කණ්ඩායම විසින් **යොදා ගැනීමට නියමිත ය**. සමාලෝචනයට ලක් කරනු ලබන රාජ්‍යයට, එකී සමාලෝචනය සිදුකරනු ලබන අවස්ථාවේ දී පනවන ලද නිර්දේශ සම්බන්ධයෙන් සිය ස්ථාවරය ප්‍රකාශ කිරීමේ අවස්ථාව පවතියි.

//නිමි//

වැඩි විස්තර සහ මාධ්‍ය ඉල්ලීම් සඳහා, කරුණාකර, *rolando.gomez@un.org* හරහා *HRC* මාධ්‍ය නිලධාරී රොලාන්ඩෝ ගෝමස්, matthew.brown@un.org හරහා *HRC* මහජන තොරතුරු නිලධාරී මැතිව් බ්‍රවුන්, හෝ *simp@un.org* හරහා *HRC* මහජන තොරතුරු නිලධාරී පැස්කල් සිම් හා සම්බන්ධ වන්න.

විශ්ව කාලාන්තර සමාලෝචනය පිළිබඳ වැඩි විස්තර ඉගෙනීමට, https://www.ohchr.org/en/hr-bodies/upr/upr-main වෙත පිවිසෙන්න.

**එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, සමාජ මාධ්‍ය හරහා අප follow කරන්න:**

Facebook | Twitter | YouTube | Instagram